# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 09/2015

අංක. 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2015.08.25

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂකවරුන්

**ලිපිකරු / ගබඩා භාරකරු /සරප්/ පරිගණක යෙදුම් සහකාර තනතුරුවල II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය**

උක්ත කරුණ සම්බන්ධයෙන් 1994.01.26 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 01/1994 මගින් සංශෝධනය කරනු ලැබ ඇති 1982.07.02 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 185 සහ 2013.12.20 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 17/2013 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2. ලිපිකරු/ ගබඩා භාරකරු/ සරප්/ පරිගණක යෙදුම් සහකාර තනතුරුවල II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණයේ II ප්‍රශ්න පත්‍රයට "සී" යනුවෙන් නව කොටසක් ඇතුලත් කිරීමට 2015.05.21 දින පැවති කොමිෂන් සභාව සිය 917 වන රැස්වීමේ දී තීරණය කර ඇත.

3. අදාල තනතුරේ III ශ්‍රේණියේ සේවය තහවුරු කළ සහ අවුරුදු හයක (06) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයන් මෙම ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

4. ඒ අනුව, ලිපිකරු, සරප්, ගබඩා භාරකරු සහ පරිගණක යෙදුම් සහකාර තනතුරුවල II ශ්‍රේණියට උසස් කිරීමේ ලිඛිත පරීක්ෂණය සඳහා වන ප්‍රශ්න පත්‍ර පහත සඳහන් පරිදි සකස් වනු ඇත.

**I ප්‍රශ්න පත්‍රය :** විශ්වවිද්‍යාලවල අණපනත්, කාර්යාල ක්‍රම ඇතුළු පරිපාලන හා විනය පරිපාටි සහ වර්තමාන සිදුවීම් හා විශ්වවිද්‍යාල කටයුතු අතර පවත්නා සම්බන්ධතාවය

අපේක්ෂකයින් ප්‍රශ්න නවයෙන් (09) ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතු වේ.

ආවරණිත විෂය ක්ෂේත්‍ර: විශ්වවිද්‍යාල පනත, නියමාවලි, ලිඛිත ව්‍යවස්ථා සහ නියෝග; පරිපාලන, ආයතන සහ විනය කටයුතු පිළිබඳ චක්‍රලේඛ උපදෙස්; කාර්යාල ලිපි හා කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලක බල මණ්ඩල වෙත ඉදිරිපත් කිරීම සඳහා සංදේශ කෙටුම්පත් කිරීම; සුචි පිළියෙල කිරීම; කාර්යාල ක්‍රම; ගොනු කිරීම්; වර්තමාන සිදුවීම් හා විශ්වවිද්‍යාල කටයුතු අතර පවත්නා සම්බන්ධතාවය යනාදිය.

**II ප්‍රශ්න පත්‍රය:** <u>ගිණුම්, මූල්‍ය හා ගබඩා පරිපාටි, අංක ගණිතය, වාණිජ අංක ගණිතය , ගණිතය සහ පරිගණක නිපුනතා</u>

අපේක්ෂකයින් පහත "ඒ", " බී" සහ "සී" කොටස්වලින් "ඒ" කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකකට (02) සහ "බී" සහ "සී" කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න එක (01) බැගින් ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුවේ.

"ඒ" කොටස - {ප්‍රශ්න හතරයි (04)}

<u>ආවරණීත විෂය ක්ෂේත්‍ර</u> : අංක ගණිතය, වාණිජ අංක ගණිතය.

"බී" කොටස - {ප්‍රශ්න තුනයි (03)}

<u>ආවරණීත විෂය ක්ෂේත්‍ර:</u> ගිණුම්, මූල්‍ය හා ගබඩා පරිපාටි.

"සී" කොටස - {ප්‍රශ්න තුනයි (03)}

<u>ආවරණීත විෂය ක්ෂේත්‍ර:</u> අන්තර්ජාලය, විද්‍යුත් තැපැල, මූලික පරිගණක ආරක්ෂණ,පද සැකසුම සහ පැතිරුම් පත් ඇතුළු ව පරිගණක නිපුනතාවය.

5. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා කාල සීමාව පැය තුන (03) කි. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

6. ලිඛිත පරීක්ෂණය සඳහා, සෑම වසරකම දෙසැම්බර් මස 31 වන දිනට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ගෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව අයදුම්පත් කැඳවනු ලැබේ.

7. 2003.01.01 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 816 ට අනුව, සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වූ යම් අපේක්ෂකයකුගේ II ශ්‍රේණියට උසස්වීම ක්‍රියාත්මක වන දිනය වන්නේ, අදාල සේවකයා, II ශ්‍රේණියට උසස්වීම සඳහා සුදුසුකම් ලැබූ දිනයයි. එනම්; ඔහු/ඇය III ශ්‍රේණියේ වසර හයක (06) සේවා කාලය සම්පූර්ණ කරන ලද දිනය වේ. කෙසේ වෙතත්, සුදුසුකම් ලැබූ යම් සේවකයෙකු උසස්වීම සඳහා සුදුසුකම් ලැබූ වසරේ දී අයදුම් නොකලේ නම් හෝ එම වසරට අදාලව පවත්වනු ලැබූ ලිඛිත පරීක්ෂණයෙන් අසමත් වූයේ නම්; එසේ වුවද, ඔහුට/ඇයට ඊලඟට නියමිත වාරයක දී, පසුව පවත්වන ලද ලිඛිත පරීක්ෂණයකින් සමත් වූයේ නම්, ඔහුගේ/අයගේ II ශ්‍රේණියට උසස්වන දිනය ඔහු/ඇය සුදුසුකම් ලැබූ දිනයට පසුදාතම් නොකළ යුතුය. එවැනි සේවකයකුගේ උසස්වීම ක්‍රියාත්මක වන දිනය පසු දාතම් කළ යුත්තේ ඔහු/ඇය සාර්ථක වූ වාරයට අදාල වර්ෂයේ නියමිත දිනට පමණි. මේ සම්බන්ධයෙන් උදාහරණයක් ඇමුණුම 1 හි දක්වා ඇත.

8. 1982.07.02 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 185 හා 1994.01.26 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 01/1994 මෙයින් අවලංගු කරනු ලැබේ.

9. කරුණාකර ඉහත විධිවිධාන අනුව කටයුතු කිරීමට සහ මෙය අදාල සියලු කාර්ය මණ්ඩලවල අවධානයට ලක් කිරීම සඳහා පියවර ගන්න.

(මහාචාර්ය මොහාන් ද සිල්වා)
සභාපති

පිටපත්:
1. ලේකම්/ උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තිය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූජීසී/එච්ආර්/2/3/199

**ඇමුණුම 1**

උදාහරණය

X නම් සේවකයකු 2005.01.15 දින ඉහත සඳහන් තනතුරුවලින් එකක III ශ්‍රේණියට පත් කර ඇති අතර, 2011.01.15 දින ඔහු වසර හයක (06) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. 11 ශ්‍රේණියට උසස්වීම සඳහා වන ලිඛිත පරීක්ෂණය පහත සඳහන් පරිදි පවත්වා ඇත.

| සුදුසුකම් ලබන වසර | ලිඛිත පරීක්ෂණය පැවැත්වූ වසර |
|---|---|
| 2011 | 2012 |
| 2012 | 2013 |
| 2013 | 2014 |

ඔහු සුදුසුකම් ලබන දිනය - 2011.01. 15

(අ) ඒ අනුව ඔහුගේ පළමුවර පෙනී සිටීම සඳහා ;

ඔහු 2012 වසරේ පවත්වන ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය

ඔහු එම පරීක්ෂණයෙන් සමත් වූයේ නම් ඔහුගේ උසස්වීම් දිනය - 2011.01.15 ( සුදුසුකම් ලබන දිනය) විය යුතුය

(ආ) ඔහු 2012 වසරේ පරීක්ෂණයෙන් අසමත් වූයේ නම්;

ඔහුගේ දෙවන උත්සාහය සඳහා ඔහු 2013 වසරේ පවත්වන ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.

ඔහු එම පරීක්ෂණයෙන් සමත් වූයේ නම් ඔහුගේ උසස්වීම් දිනය විය යුත්තේ - 2012.01.15

(ඉ) ඔහු 2013 වසරේ පරීක්ෂණයෙන් අසමත් වූයේ නම්;

ඔහුගේ තුන්වන උත්සාහය සඳහා ඔහු 2014 පවත්වන ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.

ඔහු එම වසරේ පරීක්ෂණය සමත් වී නම් ඔහුගේ උසස්වීම් දිනය විය යුත්තේ - 2013.01.15

(ඊ) කෙසේ වෙතත්, ඔහු දෙවනවර පෙනීසිටිම සඳහා 2013 වසරේ පැවැත්වූ පරීක්ෂණයට අයදුම්නොකර 2014 වසරේ පැවැත්වූ පරීක්ෂණය සඳහා පෙනී සිට ඉන් සමත් වූයේ නම් ඔහුගේ උසස්වීම් දිනය විය යුත්තේ - 2013.01.15(ඔහුගේ 2013 වසරට නියමිත දෙවෙනි වර පෙනී සිටීම ඔහු අත්හල නිසා)